# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපායස , බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 2031/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 26/07/2024<br>පැය 1350 |

## මාධ්‍ය නිවේදනය

<u>**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**</u>

**01. 2024.07.25 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 04 | 04 | 649 | 376 | තඹ දඟර 01<br>ප්ලාස්ටික් බූලි 03<br>බැරල් 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර**

2024.07.25 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ජාඇල පොලිස් වසමේ කපුවත්ත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලි ග්‍රෑම් 400 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ජාඇල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන මාලිගාවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. ජාඇල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.**

**03. බලපත්‍ර නොමැතිව වැලි පටවමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සමන්තුරය කඳවුර**

2024.07.25 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සමන්තුරය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් එරගම පොලිස් වසමේ ගල්ඔය ගඟ ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කර වැලි පටවමින් සිටි සැකකරුවෙකු වැලි පටවා තිබූ ලොරි රථයක් සමඟ අත්අඩංගුවට ගෙන එරගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වූ සමන්තුරය ප්‍රදේශයේ පදිංචිකාරුවෙකු වේ.** එරගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. නීති විරෝධී ලෙස මෙරටට ගෙන්වන රජය විසින් තහනම් කර ඇති වල් නාශක හා කෘමි නාශක ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා නෙල්ලිඅඩි කඳවුර**

2024.07.25 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා නෙල්ලිඅඩි කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් හා කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ ඒකාබද්ධව කොඩිකාමම් පොලිස් වසමේ කොඩිකාමම් දුම්රිය ස්ථානය අසලදී වැටලීමක් සිදු කර නීති විරෝධී ලෙස මෙරටට ගෙන්වන ලද ඇති වල් නාශක හා කෘමි නාශක පැකට් 4600ක් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු ලොරි රථයක් සමඟ අත්අඩංගුවට ගෙන උතුරු පළාත් කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ සහකාර පළාත් අධ්‍යක්ෂක තුමිය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 25 හා 36 වයස් වල පසුවන** විස්වමඩු හා කිළිනොච්චි යන **ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

**05. බලපත්‍ර නොමැතිව වැලි පටවමින් සිටි සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුර**

2024.07.25 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කින්නියා පොලිස් වසමේ ඊච්චන්තිව් කලපුව ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කර වැලි පටවමින් සිටි සැකකරුවෙකු වැලි කියුබ් 03 ක් පටවා තිබූ ලොරි රථයක් සමඟ අත්අඩංගුවට ගෙන කින්නියා පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක්** වන කහටගස්දිගිලිය **ප්‍රදේශයේ පදිංචිකාරුවෙකු වේ.** කින්නියා පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**